දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :- 17/2014

මගේ අංකය :- ඩී/බකොජ/2014
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2014.05. 17

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>බන්ධනාගාර නිලධාරීන් සඳහා දීමනා ලබාදීම.</u>

උක්ත කරුණ සම්බන්ධ බන්ධනාගාර නිලධාරීන්ට දීමනා ගෙවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RPR/232/01/06/02 හා 2014.04.25 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබාදී ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත.

ඒ අනුව පහත සඳහන් පරිදි නිලධාරීන්ට 2014.04.01 දින සිට එම දීමනා ගෙවීමට කටයුතු කරන ලෙස දන්වමි.

I. **සිරමැදිරි රාත්‍රී රාජකාරි දීමනාව : උපරිම රු.2000/-**

*<u>හිමි නිලධාරීන් :</u>*

මෙම දීමනාව හිමි වන්නේ ජේලර් සහ ඊට පහල නිලධාරීන් සඳහා පමණි.

- බන්ධනාගාර තුල සිරමැදිරි /වාට්ටු වල රාත්‍රී රාජකාරි කරන නිලධාරීන්
- බන්ධනාගාර තුල රාත්‍රී රාජකාරි කරන කාර්යය භාර නිලධාරීන්
- බන්ධනාගාර, එළිමහන් සිර කඳවුරු,වැඩ කඳවුරු වල රාත්‍රී සේවා භාර ජේලර්
- එළිමහන් සිර කඳවුරු,වැඩ කඳවුරු වල රාත්‍රී වාට්ටු භාර නිලධාරි
- එළිමහන් සිර කඳවුරු,වැඩ කඳවුරු වල රාත්‍රී වාට්ටු භාර කාර්යය භාර නිලධාරි
- බන්ධනාගාර සිරමැදිරිවල රැඳවියන්, රාත්‍රී කාලයේදී රඳවා තබන්නේ නම් පමණක් එම සිරමැදිරිවල රාත්‍රී රාජකාරි කරන නිලධාරීන් සඳහා එම දිනයන් වෙනුවෙන්

II. **ආරක්ෂණ රාජකාරි දීමනාව : උපරිම රු.1500/-**

*<u>හිමි නිලධාරීන් :</u>*

මෙම දීමනාව හිමි වන්නේ සාමාන්‍ය ගමන් වියදම් දීමනාව ලබාගත නොහැකි දුරකින් පිහිටා ඇති අධිකරණ සහ රෝහල් වල රාජකාරි කටයුතු කරන නිලධාරීන්

ඉහත I හා II දීමනාව වල උපරිම දීමනාව ලබාගැනීම සඳහා අනිවාර්යයෙන්ම එම රාජකාරි වල දින 10 ක් රාජකාරි ඉටු කළ යුතු අතර, ඉහත සඳහන් දින ගණන සම්පූර්ණ නොකරන අවස්ථාවලදී අනුපාතිකව ගණනය කර ගෙවිය යුතුය.

III. යහපත් කල් ක්‍රියා දීමනාව : උපරිම රු.400/-

*__හිමි නිලධාරීන් :__*

සැරයන් හා ඊට පහල ඊට පහල නිලධාරීන් සඳහා

- සේවා කාලය අවුරුදු 04 ට පසු - රු.100/-
- සේවා කාලය අවුරුදු 08 ට පසු - රු.150/-
- සේවා කාලය අවුරුදු 12 ට පසු - රු.200/-
- සේවා කාලය අවුරුදු 16 ට පසු - රු.300/-
- සේවා කාලය අවුරුදු 20 ට පසු - රු.400/-

ඉහත III දීමනාව පහත සඳහන් කොන්දේසි වලට යටත් වන්නේය.

- ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ XVLIII පරිච්ඡේදයේ 1 වන උපලේඛනය යටතේ විෂමාචාරයකට වැරදිකරු වී දඬුවම් ලබා ඇත්නම්, එකී වරද සිදු කළ දින සිට වසර 04 ක් ගතවන තුරු ඉහත දීමනාව ලබාගත නොහැක.
- ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ XVLIII පරිච්ඡේදයේ 11 වන උපලේඛනය යටතේ විෂමාචාරයක් සම්බන්ධයෙන් වැරදි කරු වී දඬුවම් ලබා ඇත්නම්, එකී වරද සිදු කළ දින සිට වසර 02 ක් ගත වන තුරු ඉහත දීමනාව ලබාගත නොහැක.
- රාජකාරියේදී සිදු වූ කිසියම් සුළු වරදකට අවවාද හෝ තරයේ අවවාද ලබා ඇති අවස්ථාවකදී එකී වරද සිදු වූ දින සිට වසරක් ගත වන තුරු ඉහත දීමනාව ලබාගත නොහැක.

ඉහත I හා II දීමනා ලබාගැනීම සඳහා අදාළ මාසය තුල දින 24 ක් අවම වශයෙන් සේවය කළ යුතු අතර, ඊට අඩුවන සෑම අවස්ථාවකදීම අනුපාතිකව දීමනාව අඩු කළ යුතුය.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :- බන්ධනාගාර කොමසාරිස් (මුදල්) - දැ.ගැ.ස.

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத் திறைசேரி, நிதி, திட்டமிடல் அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance and Planning, Colombo 01, Sri Lanka.
**Web Site** : www.treasury.gov.lk **e-mail** : budget@nbd.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. BD/RPR/232/01/06/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2014.04. 25

12 MAY 2014

12 MAY 2014

ලේකම්,
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

ලේකම්තුමනි,

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා දීමනා ලබාගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් අප දෙපාර්තමේන්තුවට ද පිටපතක් සහිතව ජනාධිපති ලේකම්තුමා වෙත යවන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක බ.කො.ජ./ලි.ගො.අ.111/2014 හා 2014.03.22 දිනැති ලිපිය හා 2014.04.04 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාව හා බැඳේ.

02. එම සාකච්ඡාවේදී තීරණය වූ පරිදි, බන්ධනාගාර සේවයේ පවතින සුවිශේෂී කාර්යයන් සඳහා නිලධාරීන්ගේ කැපවීම හා කාර්යක්ෂමතාවය තවදුරටත් ඉහළ නංවාලීම අරමුණු කොටගෙන බන්ධනාගාර නිලධාරීන් සඳහා අදාල පහත සඳහන් දීමනා 2014.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික වැටුප් කොමිසමේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

| දීමනාව | මාසික උපරිම සීමාව (රු.) |
|---|---|
| 01. විදුලි දීමනාව - තවදුරටත් ක්‍රියාත්මක කිරීමට (විදුලි නියාමක හා ඕවර්සියර් නිලධාරීන් සඳහා පමණක්) | 100 |
| 02. රාත්‍රි සංචාර දීමනාව - තවදුරටත් ක්‍රියාත්මක කිරීමට (ජේලර්වරුන් සඳහා පමණක්) | 4000 |
| 03. සිරමැදිරි රාත්‍රි රාජකාරි දීමනාව (ජේලර් සහ ඊට පහළ නිලධාරීන් සඳහා) | 2000 |
| 04. ආරක්ෂණ රාජකාරි දීමනාව (අධිකරණ රාජකාරි කටයුතු ඉටුකරනු ලබන නිලධාරීන් සඳහා) | 1500 |
| 05. යහපත් කල්ක්‍රියා දීමනාව (සැරයන් සහ ඉන් පහළ නිලයන් සඳහා) | අවුරුදු 4 කට පසු - 100<br>අවුරුදු 8 කට පසු - 150<br>අවුරුදු 12 කට පසු-200<br>අවුරුදු 16 කට පසු-300<br>අවුරුදු 20 කට පසු-400 |

මෙයට - විශ්වාසී,

ජේ.ඩී.සී.ඒකනායක මෙය
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-
1. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
2. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094-11-2484665, 0094-11-2484639 (Fax)
කාර්යාලය / அலுவலகம் / Office: 0094-11-2484669, 0094-11-2484853
ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No.: 0094-11-2484807